**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල**

විෂය-ව්‍යාපාර සංඛ්‍යානය

සතිය- 2

ශ්‍රේණිය-12

සකස් කළේ - රත්නපුර කලාප අධ්‍යාපන කාර්යාලය

Department of Education,Sabaragamuwa Province/ Weekly School

**<u>ගැටළු විසඳීමට ස්වායත්තතාව පිළිබඳ සම්භාවිතා ප්‍රමේයයන් භාවිත කිරීම.</u>**

1.)පහත සඳහන් එක් එක් සිද්ධි යුගලය ඇසුරෙන් ස්වායත්ත සිද්ධි වෙන් කර දක්වන්න.

1. එකම වර්ගයේ දෙහි රස ටොෆි 3ක්ද ,අන්නාසි රස ටොෆි 4ක්ද අඩංගු භාජනයකින් අහඹු ලෙස ප්‍රතිෂ්ඨාපන සහිතව අනුයාත ලෙස ටොෆි 2ක් ඉවතට ගැනීම.
2. පියා වෛද්‍යවරයෙකු වීම හා පුතා ගුරුවරයෙකු වීම.
3. ජයමිණි විශ්ව විද්‍යාලයට තේරීම සහ ජයලත් විශ්ව විද්‍යාලයට තේරීම.
4. ශ්‍රී ලාංකික ශිෂ්‍යයෙක් එකම අධ්‍යයන වර්ෂයේදී වෛද්‍ය පීඨයට තේරීම හා නීති පීඨයට තේරීම.
5. තත්ත්ව පාලකවරයෙක් එක්තරා දිනයක පරීක්ෂාවට භාජනය කළ පළමු තොගය ප්‍රතික්ෂේප කිරීම හා දෙවන තොගය ප්‍රතික්ෂේප කිරීම.
6. භාර ගත් ඇණවුමක් සම්පූර්ණ කිරීම සඳහා ලැබීමට නියමිත අමුද්‍රව්‍ය තොගයක් ප්‍රතික්ෂේප වීම හා අදාළ ඇණවුම නිම කිරීම.

2.) පිරිමි ළමුන් 30ක්ද ,ගැහැණු ළමුන් 20ක්ද සිටින පන්තියක අඩි 5ට වඩා උස පිරිමි ළමුන් 6ක්ද , අඩි 5ට වඩා උස ගැහැණු ළමුන් 5ක්ද සිටී නම් එම තොරතුරු වෙන් රූප සටහනක ලකුණු කරන්න.